# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PC&PR/09/2024 ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. දිනය / திகதி / Date 2024.05.30

## මාධ්‍ය නිවේදනය

**<u>මධ්‍යම පරිසර අධිකාරිය මධ්‍යස්ථාන 97ක දී විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එකතු කරයි.</u>**

එළෙඹෙන ජුනි මස පස් වෙනි දිනට යෙදෙන ලෝක පරිසර දිනය නිමිති කර ගනිමින් පළාත් හතරක පිහිට වූ මධ්‍යස්ථාන 97 දී 2024 ජුනි මස 03 සහ 04 යන දෙදින විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු යොදා ඇත. ඒ අනුව, එම දින දෙකෙහි දී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා ඔබගේ නිවසේ හෝ කාර්යාලයේ ඇති විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එම මධ්‍යස්ථාන වෙත ගෙනැවිත් නොමිලේ භාර දිය හැකිය.

බස්නාහිර පළාත තුළ මධ්‍යස්ථාන 28ක් ද දකුණු පළාත තුළ මධ්‍යස්ථාන 39ක් ද නැගෙනහිර පළාත තුළ මධ්‍යස්ථාන 14ක් ද ඌව පළාත තුළ මධ්‍යස්ථාන 16ක් ද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමට මෙම වැඩසටහනට අදාළව පිහිටුවා ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ ක්ෂණික දුරකථන අංකය වන 1981 ඇමතීමෙන් හෝ මේ සඳහා පත් කර ඇති මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිලධාරීන් ඇමතීමෙන් එක් එක් දිස්ත්‍රික්ක වල මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ලබා ගත හැකිය. (කොළඹ - සංජීව මහතා - 0718418074, කළුතර - කල්පනී මහත්මිය - 0713101878, ගම්පහ - උපුල් මහතා - 0776906657, මාතර - සීකුබද්‍ර මහතා 0716865796/ පලිහක්කාර මහතා - 0714395981, ගාල්ල - ලලිත් මහතා - 0718352889, හම්බන්තොට - ධනුෂ්ක මහතා - 0718442950, මඩකලපුව - සතීස් මහතා - 0743096894/ ඇන්ටන් මහතා - 0769877849, අම්පාර - කිත්සිරි මහතා - 0773317710, ත්‍රිකුණාමලය - රාෆි මහතා - 0772389855/ කාදර් මහතා - 0779688899, මොනරාගල - බණ්ඩාර මහතා - 0718291798/ කුමාර මහතා - 0711782211, බදුල්ල - මාරසිංහ මහතා - 0714189936/ ප්‍රේමරත්න මහතා - 0760968110.)

සංයුක්ත ප්‍රතිදීප්ත (CFL බල්බ), රේඛීය ප්‍රතිදීප්ත පහන් (Tube බල්බ), CRT මොනිටර්ස්, කොටස් කර ඇති හෝ අභ්‍යන්තර කොටස් ගලවා ඇති විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ ද පස්, වැලි හා මඩ තැවරී ඇති විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ ද හැර අනෙකුත් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය මෙම වැඩසටහනේ දී භාර ගනු ලැබේ. එලෙසම කර්මාන්තායතන, වෙළෙඳසැල් මගින් විශාල ප්‍රමාණවලින් ගෙන එනු ලබන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය මෙම වැඩසටහනේ දී භාර නොගන්නා අතර ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය පමණක් භාර ගනු ලැබේ. (භාර ගන්නා සහ භාර නොගන්නා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍යයන් හි සවිස්තර නාම ලේඛනය මේ සමඟ අමුණා ඇත. (පිටුව - 3))




| Chairman | | Director General | General Office | Complaints Hotline : 1981 | | |
|---|---|---|---|---|---|---|
| Tel : 2872361,2124605<br>Fax : 2872347 | | Tel : 2872359, 2124613<br>Fax : 2872608 | Tel : 2872278, 2873447, 2888999, 2124600 | | | |
| Deputy Director Generals | HRD, Admin. & Finance<br>Tel: 2124610 | Envt. Pollution Control<br>Tel : 2124618<br>Fax : 2872605 | Envt. Mgt. & Assessment<br>Tel : 2124626<br>Fax : 2872296 | Envt. Edu. & Awareness<br>Tel : 2124614<br>Fax : 2872609 | Waste Management<br>Tel : 2124634<br>Fax : 2882152 | Regional Operation<br>Tel : 2124638<br>Fax : 2872275 |

පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හා නිසි පරිදි බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබාදෙන උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රලාභී ආයතන හරහා පමණක් මෙලෙස එක්රැස් කරනු ලබන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය අපහරණය කිරීම සිදු කරයි. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ආරක්ෂිත ලෙස කොටස්වලට වෙන්කර ශ්‍රී ලංකාව තුළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ප්ලාස්ටික්, යකඩ වැනි කොටස් මෙරට දී ප්‍රතිචක්‍රීකරණයට යොමු කරනු ලබන අතර ඉතිරි කොටස් අදාළ ප්‍රතිචක්‍රීකරණ හා නිෂ්කර්ෂණ පහසුකම් සහිත රටවලට අපනයනය කරනු ලැබේ. එහිදී ජාත්‍යන්තර සම්මුතීන්ට (බාසල් සම්මුතියට) අනුකූලව මෙම අපනයන කටයුතු සිදුකරනු ලැබේ.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර නොකිරීම මගින් මිනිසුන්ට, සත්වයින්ට, ශාකවලට මෙන්ම පරිසරයට ද සිදුවන හානිය අවම කිරීමේ අරමුණින් ගෘහස්ථ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ මෙම වැඩසටහන සංවිධාන කර ඇත. භාවිතයේ පහසුව සහ තම කාර්යයන් පහසුකර ගැනීම සඳහා මිනිසුන් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ භාවිතයට ප්‍රියකරයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ භාවිතය සීග්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර දිනෙන් දින විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ භාවිතයේ ප්‍රවණතාව ද වැඩිවෙමින් පවතී. එලෙසම, අතීතයට සාපේක්ෂව වර්තමානය වන විට විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණවල ආයුකාලය ද අඩුවෙමින් පවතී. මෙම තත්වය හමුවේ ජනනයවන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ප්‍රමාණය සැලකියයුතු ලෙස ඉහළයාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. සියලුම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපාංගවල රසදිය, ඊයම්, කැඩ්මියම්, ඇන්ටිමනි, බෙරලියම්, ආසනික් වැනි බැර ලෝහ වර්ග හා වෙනත් විවිධ වූ විෂ රසායනික අඩංගුවන බැවින් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කළහොත් මිනිසාගේ සෞඛ්‍ය තත්වයට මෙන්ම සත්වයින්ගේ පැවැත්මට ද පරිසරයට ද හානි පමුණුවයි. තවද, මෙම විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍යවල අන්තර්ගත වන බැර ලෝහ සහ අනෙකුත් උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය විවිධ ක්‍රම මගින් ගංගා ජලය සමඟ මුසුවන බව පර්යේෂණ අනුව තහවුරුවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍යමය සහ පාරිසරිකමය වශයෙන් බරපතල හානිකර තත්වයන් ඇතිවේ.

ජගත් පරිසර දිනය නිමිත්තෙන් රජය ප්‍රකාශයට පත් කර ඇති "ජාතික පරිසර සතිය"ට සමගාමීව සිදුකරනු ලබන පරිසර සුරක්ෂිතතා වැඩසටහනක් ලෙස විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මෙම වැඩසටහන සංවිධාන කර ඇත.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

වෙනුර ප්‍රනාන්දු
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය

# 2024 ජගත් පරිසර දිනය නිමිත්තෙන් පැවැත්වෙන
# විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහන
# 2024 ජුනි මස 03 සහ 04 දෙදින

## එකතු කරන සහ එකතු නොකරන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය ලැයිස්තුව

### එකතු කරන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික අපද්‍රව්‍ය

01. රූපවාහිනී යන්ත්‍ර
02. කැසට් යන්ත්‍ර/රේඩියෝ යන්ත්‍ර
03. විදුලි පංකා
04. පරිගණක/ ලැප්ටොප්
05. මොනිටර් (LED, LCD පමණි)
06. ජංගම දුරකථන සහ උපාංග
07. ස්ථාවර දුරකථන
08. ෆැක්ස් යන්ත්‍ර
09. ඇඹරුම් යන්ත්‍ර (බ්ලෙන්ඩර් සහ ග්‍රයින්ඩර්)
10. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික සෙල්ලම් බඩු
11. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික ක්‍රීඩා භාණ්ඩ/ විද්‍යුත් ව්‍යායාම උපකරණ
12. ටෝනර් කාට්රිජ්
13. රයිස්කුකර්
14. මුද්‍රණ යන්ත්‍ර (ප්‍රින්ටර්)
15. බැටරි (මෝටර් රථ/ යතුරුපැදි/ ජංගම දුරකථන/ ඔරලෝසු)
16. CD/ DVD යන්ත්‍ර
17. CD සහ DVD තැටි
18. විදුලි කේතල/ විදුලි හීටර
19. විදුලි උඳුන්
20. LED බල්බ
21. රෙදි සෝදන යන්ත්‍ර
22. ශීතකරණ
23. වායු සමීකරණ
24. වෙනත් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ

### එකතු නොකරන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොණික උපකරණ

1. සංයුක්ත ප්‍රතිදීප්ත (CFL බල්බ)
2. රේඛීය ප්‍රතිදීප්ත පහන් (Tube බල්බ)
3. CRT මොනිටර්ස්
4. කොටස් කර ඇති හෝ අභ්‍යන්තර කොටස් ගලවා ඇති උපකරණ
5. පස්, වැලි හා මඩ තැවිරී ඇති උපකරණ
6. කර්මාන්තායතන, වෙළෙඳසැල් මඟින් විශාල ප්‍රමාණවලින් ගෙන එනු ලබන විද්‍යුත් අපද්‍රව්‍ය